# 'අතුරු මිතුරු' හටන

"ඒ වැඩෙත් ඉවරයි" ! පන්හිඳ ලොකු හුසමක් හෙළුවා.

"ඔය අත ඇරිය මාස කීයකට කලින් ඉහළට ඇදදාන්න හුස්මද ?" පින්සල පන්හිඳට උණු කෝපි කෝප්පයක් ගෙනත් දුන්නා.

"ඇත්තටම මේ මාස හතරකට විතර උඩදි උඩට ගන්න හුස්ම තමයි" පන් පින්ට උත්තර බැන්දේ කෝපි උගුරක් බොන ගමන්.

"පන් ගේ හුස්මට තව කී දෙනෙක්ගේ හුස්මවල් එකතු වුණා ද ? ඒ හැමෝම ඒ හුස්මවල් ආපහු හුළඟට එකතු කළේ දහ වෙනිද රෑ....." ඒ පැන්සල. උදේට කන්න මොනවා හරි හදන්නයි පැන්ගේ ලැස්තිය.

මේ අය මේ කතා කළේ කලින් ද රෑ බර්ප්‍රුඩ් වල කෙල් වොට්සන් ශාලාවේ තිබුණ "අතුරු මිතුරු" ළමා ප්‍රසංගය ගැන.

"වැඩක් පටන් ගන්නකොට මම හොඳ පොතක් තෝරාගන්නවා කෝච්චියේදි කියවන්න." පන් මතකය මතක් කළා.

"මේ වැඩේදි මොකක්ද පන් තෝරගත්ත පොත ? " පින් උනන්දුයි හරියට ඔය දේවල් ගැන.

"මාර්ටින් විතුමසිංහ මහත්තයාගේ "රෝහිණී" !

ගැමුණු කුමාරග සේනා එක්රැස් කරලා විජිත පුර සටහේදී එළාර රජුරුවෝ එක්ක හටන් කරලා දිනපු කතාවයි රෝහිණී නවකතාවට පසුබිම වෙන්නේ.

"මමත් එකතු කරගත්තා දස මහා යෝධයින් කණ්ඩායමක්. සේනා රැස් කළා. විජිතපුර හටන කෙල්වොට්සන් ශාලාවේදි කළා." පන්ට හරි සතුටුයි.

"ඇත්තටම සේනාවක්, සේනාධිපතිවරු පිරිසක් නැතිව හටනක් නෑ. කවුද ඉතින් මේ සේනාව ?"

"මෙල්බර්න් නුවර ළමා ප්‍රසංග වලදී තමුන්ගේ උපන් හපන්කම් පෙන්නපු, තමන් ඉගෙනගත්ත ශිල්ප පෙන්නපු අපේම දරුවෝ තමයි මේ මහා සේනාව. ඇත්තටම අසුවකට වැඩිය උන්න මේ සේනාව ගැන නම් කියන්න ගියොත් ඒක මහ දිග ලැයිස්තුවක්..."

"ඉතින් කොහොමද මේ අයව තෝරගත්තෙ ? මේ වැඩේට දායක කරගත්තේ ?"

"ඒ ඒ අය හපන්කම් පෙන්වපු තැන්වලින්ම තමයි ඒ අයට ඒ හපන්කම් දුන්න දෙමව්පියන්වයි, ඒ අයගේ ඒ හපන්කම් දියුණු කරන ගුරුවරු, වැඩිහිටියන්වයි තමා සේනාධිපතිවරු වගේ මේ දරුවන්ට මඟ පෙන්නන්න පෙරමුණ ගන්න බඳව ගත්තෙ. හැබැයි අළුත් හටනකට, අළුත් ආයුධවලින්."

"අළුත් හටනකට ?"

"ඔව් අපේ හටන වුනේ ළමයින් ගැන නොහිතන, ළමයින්ට ඉඩක් නොදෙන, ළමයින්ව පාවිච්චි කරන, ළමයින්ව විකුණන අයගේ වගේම මාධ්‍යවල ඇස් අරවන එක."

"එතකොට අළුත් ආයුධ ?"

"අළුත් ම ගී විස්සක්. ඒ "අතුරු මිතුරු" මිතුරු සංගත තැටියේ ගීත. හැබැයි මේ හටනට නොගැලපෙන අළුත් ආයුධත් තිබුණ. ඒවා පොඩ්ඩකට පැත්තකින් තියලා පරණ ආයුධ දෙක තුනකුත් සංගත තැටිය කළාට පස්සේ නිර්මාණය කරගත්ත ආයුධ කීපයකුත් යොදගන්න වුණා."

"මේ ගීත ආයුධ කොහොමද මේ ළමා සේනාවට බෙදලා දුන්නේ ?"

"ඒ කාලේ තිබුන හටන් පුහුණු මධ්‍යස්ථාන වගේ මෙල්බර්න් වල තියෙන නැටුම් පුහුණු කරවන ආයතන, නාට්‍ය පුහුණු කරවන ආයතන, ගැයුම් පුහුණු කරවන ආයතන, ඒ වගේම විත්‍ර අඳින්න පුහුණු කරවන අය, සිංහල භාෂා පාසැල් වල විවිධ ප්‍රසංග, කෙටි නාට්‍ය උත්සව, කෙටි විත්‍රපට උත්සව වගේ දේවල් දකින්න බලන්න පහුගිය කාලයේ අපිට වාසනාව ලැබුණා. ඒ දේවල් ගැන කතාකරන්න අපට මාධ්‍යවල ඉඩ ලැබුණා. ඉතින් ඒ ඒ අයට ගැලපෙන ගීත ආයුධ බෙදලා දෙන්න පුළුවන් වුණා. හටන්න දන්න අයට දුන්නේ නැටුම් ගීත. රඟන්න දන්න අයට දුන්නේ ප්‍රසාංගික ගීත. මෙහේ දරුවන්ට සපීවී ගයන්න පුළුවන් ගීත ඒ අංශයෙන් දක්ෂ අයට දුන්නා. විත්‍ර අඳින්න ළමා මනසේ චිත්ත රූප මවන්න පුළුවන් ගීත විත්‍ර අඳින අයට ඒ ඒ වයසට ගැලපෙන්න දුන්නා. නිවේදන කටයුත්තක් ප්‍රසාංගිකව ඉදිරිපත් කිරීමත් තමන් අතට ගත්තා. මොකද ඒක හරියට නොවුනොත් අනික් හැමදෙයක් ම දියාරු වෙන නිසා. ඒත් දෙවෙනි භාගයේදී ඒ අංශය කරගෙන යන්න ශ්‍රීනාත් මද්දුමගේ හිතවතාටයි, හිමිනා රූපසිංහ දුවටයි භාර දුන්නා. සංගත තැටිය එළිදක්වන කටයුත්ත පැතුම් තිලකසිරි හිතවතා ට භාර දුන්නා. ඒ වෙනසක් ඇති කරවන්න."

"මේ සේනාධිපතිවරු කවුද ?"

"සංගීතය මෙහෙයවේවෙ තරුපති මුණසිංහ සෙනෙවියා. ගායන බලකායේ බොහොම දෙනෙක් පුහුණු කළෙත් ඒ සෙනෙවිතුමා. ඒ වගේම වාසනා වීරකෝන්, චමරි වීරකෝන් සංගීතාචාර්යවරියනුත් ඒ කටයුත්තට හවුල් වුණා. නැටුම් බලකායේ සෙනෙවිවරු කීපදෙනෙක්ම හිටියා. රශිකා කුලසිංහ, දිනේෂ් ඈපාසිංහ, චන්දි මාපා, විනිතා විජේරත්න තමයි ඒ සෙනෙවි මඩුල්ල. රඟපෑම් පුහුණු කළේ කුසුම්සිරි ලියනාරච්චි සෙනෙවියායි, ශ්‍රීනාත් මද්දුමගේ සෙනෙවියායි, ශිරෝමි ප්‍රනාන්දු සෙනෙවි තුමියයි. විත්‍ර අංශය බාරගත්තේ තමුන්නැහේනේ ?" පන් පින්සල දිහාට හැරුණා.

"ඔව් විත්‍ර බලකාය මෙහෙයවන්න අපි තෝරගත්තේ මනෝරි බණ්ඩාරනායක හිතවතිය. පනහකට වැඩි සේනාවක් එක්ක වැඩමුළු පවත්වලා ඒ අංශය ඉස්සරහට ගෙනාවෙ මනෝරි. විත්‍ර ඡායාරූපගත කරලා පිළිවෙලක් කළේ මනෝරිගේ දයාබර සැමියා වික්ටර වෛද්‍යරත්න හිතවතා. පරිගණක ඉදිරිපත් කිරීමත් සකස්කළේ මනෝරිමයි. ඒ ඉදිරිපත් කිරීම ප්‍රසංගයේ තිරගත කරන්න පිළියෙල කරලා, තිරගත කළේ උපා උපදස සෙනෙවියායි. ඒ කොටස ඉදිරිපත් කරන්න කථනයෙන් සහය වුනේ ස්වර්ණා උපදස හිතවතියයි. ශාලාවේ ඉදිරි ආලින්දයේ විත්‍ර ප්‍රදර්ශනය පිළියෙල කරලා සජීවිව විත්‍ර ඉදිරිපත් කළේත් විශ්ව වෛද්‍යරත්න සෙනෙවියාය. ප්‍රධාන දොරටුව අලංකාර කරන්න භාරවුනේ සරත් විජේරත්න හිතවතාටයි."

"ඒ කලාත්මක බලමුළුව. එතකොට තාක්ෂණික බලමුළුව ? " පන් පැන්සලට ප්‍රශ්ණාර්ථය තිබ්බා.

"ආලෝකකරණය ජගත් කොතලාවල සෙනෙවිතුමාට පැවරුණා. ශබ්ද පරිපාලනය කළේ සමිත ජයතිලක සෙනෙවිතුමාට. මේ අය එකතු කරගෙන වේදිකාව පරිපාලනය කළේ ගාමිනී රණසිංහ සෙනෙවිතුමා. හර්ෂ බණ්ඩාර ජයලත් රංගන විද්‍යාසයෙන් මේ සෙනෙවියන්ට එකතුවුණා. මේ අයට ලක්ෂ්මන් ගමගේ, වසන්ත කස්තූරිරත්න, පියත් දිසානායක, රක්ෂන් විමලසූරිය, සිසිර දිසානායක කියන පිරිස දායක වුණා."

මේ බලකායට අමතරව ප්‍රසංගයේ ප්‍රේක්ෂකාගාරය වෙනුවෙන් තිස්ස ගෝවින්න, ලක්ෂ්මන් ද සිල්වා, නන්දන ඇතුලත් මුදලි, පද්මා දිසානායක, උදිනා කාලංගමුදලි, අනෝජා කරුණාරත්න, ලලි ජයලත්, යමුනා දහනායක වාගේ පිරිසකගෙන් හැඳුන බලකායකුත් යොදගත්ත වුණා. ඒ අතරට ජායාරූප ගන්න මහේන්දු කාලිංගමුදලි හිතවතාත් වීඩියෝ දර්ශන ගත කරන්න හේමාල් ගුරුසිංහ හිතවතාත් එකතු වුණා."

"ඔය කියනකොටයි මටත් මතක් වුණේ. ගායනයෙන් රෝහණ කරුණාරත්න හිතවතාත්, රංගනයෙන් නන්දසිරි ද සිල්වා සහ පුෂ්පිකා ගමගේ දෙපළත් ඒ ඒ බලකායන් වලට එකතු වුණා." ඒ පන්.

"ඇයි වේදිකා අලංකරණය කළේත් ගාමිනී රණසිංහ සෙනෙවියානේ ? "ඒ පින්.

"ඉතින් අපි මේ "අතුරු මිතුරු" හටන දිග්නද ?" පන්, පින්, පැන් තුන්දෙනාටම එකට කියවුණා.

"මට හිතෙන්නේ මේ හටනේ ජය පරාජය අතීත වර්තමාන හා අනාගත කියන කාල තුනට අනුව අදියර තුනකට වෙන් වෙනවා. " පැන්සල පණ්ඩිත වාක්‍යයක් කිව්වා.

"ඒ කියන්නේ ?" හැමදමත් පින්සලට ඔයවගේ දේවල් ප්‍රශ්ණයක් "

"අපි අතීත හටන දිග්නා. හටන හරියට දියත් කළා. ශාලාව පිරි ඉතිරියන ප්‍රේක්ෂාගාරයක අඩාධයක් නැතිව සේනාවයි, සේනාවේ කීර්තියයි රැකගෙන හටන දියත් කරලා දිග්නා. ඒත් ඉතිරි ජයග්‍රහණ තියෙන්නේ වර්තමානයත්, අනාගතයත් අතේ. දරු-වන්ට අද දවසේ අපේ කටයුතු වලදී වැඩි ඉඩක් ලබා දෙනවානම් ඒකයි අපේ වර්තමාන ජයග්‍රහණය. මාධ්‍යවල, වගකිවයුත්තන්ගේ ඇස් මේ ගෙවෙන අද දවසේ ළමයින්ගේ දේවල් ගැන ඇරිලා තිබුණොත් ඒකයි අද අපි ලබන දිනුම. ඒ දේවල් නිසා හෙට දවසේ දක්ෂ ළමා පිරිසකුයි ඒ ළමා පිරිසෙන් බිහි-වෙන වැඩිහිටි පිරිසකුයි දකින්න ලැබෙනවානම් ඒකයි අපි අනාගතයේ ලබන ජයග්‍රහණය." පැන්සල විග්‍රහ කළා.

"ඒ කියන්නේ අපි තවම දිනලා තියෙන්නේ තුනෙන් පංගුවක් විතරයි ?" පින්සල "අතුරු මිතුරු" ළමයි තුන්දෙනා ආයිමත් අඳින ගමන් ඇහුවා.

"ඇත්තෙන්ම ඔව්. ඒ වුණත් මේ හටනට මුදල් අතින් උර දුන්න ඩෙනසිල් ජයවීර සෙනෙවියා ඇතුලු අනුග්‍රාහක බලකායටත්, වෙළඳ දැන්වීම් ලබාදුන්න හිතවත් බලමුළුවටත් දේශනය පවත්වපු ජගත් ජේ. එදිරිසිංහ හිතවතාටත් ළමා සෙබල හා දෙමාපිය ගුරුවර සෙනෙවියන්වත් අපි ස්තූතිවන්ත වෙන්න ඕන. ඒ වගේම හටන බලන්න ඇවිල්ලා අපි වෙනුවෙන් අප්පුඩි තලපු, ඔල්වරසන් දුන්න අයටත් ස්තූති කරන්න ඕන. මොකද මේ හටනේ වටිනාකම තේරුම් ගන්න නිසාත්, අපිව ධෛර්යමත් කරපු නිසාත්" පන්හිඳ කිව්වා.

**JAPURA ALUMNI AUSTRALIA INC**
65 Panoramic Grove Glen Waverley VIC 3150
Ph : 95 61 55 95.

JAPURA ALUMNI AUSTRALIA INC.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ විද්‍යාර්ථීන්ගේ සංගමය මගින් සංවිධානය කරනු ලබන සිංහල අවුරුදු උත්සවය, ජ'පුර බක්මහ සැන්දෑව 2012 අප්‍රේල් මස 14 වන සෙනසුරාදා පෙව 11.30 සිට අංක 649 Ferntree Gully Road, Glen Waverley හි බ්‍රැන්ඩන් පාක් ප්‍රජා ශාලාවේදි පැවැත්වේ.

මෙල්වේ යොමුව 71 C8

පාරම්පරික ජන ක්‍රීඩා හා විනෝදාංශ රැසකින් යුතු මෙම අවස්ථාවට සහභාගී වන ඔබට වටිනා තෑගි ද දිනා ගත හැකිය. මේ සඳහා සහභාගී වන ලෙස සංගමය ඔබ සැමට ආරාධනා කරයි!

ප්‍රණීත රස කැවිලි සහිත සම්ප්‍රදායික අවුරුදු කෑම මේසය පෙ.ව. 11.30 ට ආරම්භ වේ.

වැඩි විස්තර japuraalumni.com වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.